කොටගල ප්‍රාදේශීය සභාව - 2021

1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

කොටගල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කොටගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

ගිණුම්කරණ අඩුපාඩු

---

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් ඉඩම් දෙකක වැටවල් වැඩි දියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.5,755,374 ක වියදමක් දරා තිබුණද එම වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි . | 2022 වර්ෂයේ සකස් කරන මූල්‍ය ප්‍රකාශනය තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බවට දන්වා ඇත. | ප්‍රාග්ධන වියදම් ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සභාවට අයත් වත්කම් වැඩිදියුණු කිරීම සඳහා රු.4,531,256 ක් ඉකුත් වර්ෂය තුළ වැය කර තිබුණද එම වත්කම් ආදායම් පරීක්ෂක නිලධාරි විසින් රු.1,775,000 කට තක්සේරු කර වත්කම්වල වටිනාකම රු.2,756,256 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි . | 2022 වර්ෂයේ සකස් කරන මූල්‍ය ප්‍රකාශනය තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බවට දන්වා ඇත. | වත්කම්වල වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු සභාවට අයත් ලෝවිල් වත්තේ කසළ බැහැර කරන ස්ථානයේ පිහිටි ඉඩමේ රු.59,878,500 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2022 වර්ෂයේ සකස් කරන මූල්‍ය ප්‍රකාශනය තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බවට දන්වා ඇත. | වත්කම්වල වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශනවල රු.24,540 ක වියදම් හා රු.843,456 ක වගකීම් ලෙස අවස්ථා 02 කදී එකතුව රු.867,996 ක් අඩුවෙන් දැක්වීමද, රු.3,266,997 ක වත්කම් හා රු.917,220 ක වගකීම් ලෙස අවස්ථා 02 කදී එකතුව රු.1,383,512 ක් වැඩියෙන් දැක්වීමද, පැවතුණි. | 2022 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | යන්ත්‍ර උපකරණ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු රු.8,964,276 ක වත්කම් විෂයයන් 07 ක වටිනාකම කාර්යාල උපකරණ යටතේ දක්වා තිබුණි. | 2022 වර්ෂයේ සකස් කරන මූල්‍ය ප්‍රකාශනය තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බවට දන්වා ඇත. | වත්කම් ශේෂයන් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,404,452 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,100,415 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

------------------------

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

----------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| i. | නව ප්‍රාදේශීය සභා පිහිටුවීමේදී 2018වර්ෂයේදී නුවරඑළිය ප්‍රාදේශීය සභාවෙන් පවරාදෙන ලද, ඒකක 545 ක් සඳහා පුද්ගලයන් 742 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු 2,247,517 . ක හිඟ වරිපනම් බදු මුදල 2021 දෙසැම්බර් 31 දින වනවිටද අය කර නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |
| ii. | වසර 01 සිට වසර 05 අතර කාල පරාසයක් ගත වී ඇති රු.1,930,908 ක ශේෂයක්ද ,වසර 05 ට වැඩි කාලයක් හිඟහිටි රු.1,279,859 ක හිඟ ශේෂයක්ද, ලෙසට ඒකක 905 කින් පුද්ගලයින් 1433 දෙනෙකුගේ එකතුව රු.3,210,767 ක වරිපනම් බදු අය වී නොතිබුණ නිසා ආදායම් අය කිරීමේ කාර්ය සාධනය ප්‍රමාණවත් මට්ටමක නොතිබුණි . | 2022 අගෝස්තු 10 දින වනවිට රු.105,463 ක් අය වී ඇති බවත්, ඉතිරි මුදල් නොපමාව අය කරන බවත් දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |
| (ආ) | වෙනත් ආදායම් | | |
| | ඉකුත් වර්ෂයට අදාළ ත්‍රීරෝද රථ නැවතුම්පලවල් හයක ත්‍රීරෝද රථ 97 ක් වෙනුවෙන් අයවිය යුතු ගාස්තු රු 242,500.ක් සහ සමාලෝචිත වර්ෂය සඳහා ත්‍රීරෝද රථ නැවතුම්පලවලින් අයකළ යුතු ගාස්තු කිසිවක් අයකර නොතිබුණි . | ත්‍රීරෝද රථ නැවතුම්පළවල් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගවල පිහිටා ඇති හෙයින් ඒ සඳහා නිසි අවසරයක් ලබා ගැනීමට නොහැකිවීම, නිසා මෙසේ වූ බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 ව්‍යාපෘති, කර්තව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොටගල කුඩාඔය පිහිටි සභාවට අයත් පර්චස් 55 ක ආගිල් කොම් ඉඩම වටා වැටක් සවි කිරීම සඳහා රු 398,385.ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත 2021 මැයි 26 දින ගෙවා තිබුණි. 2021 අගෝස්තු 26 දින වනවිට කර්මාන්තය නිමකළ යුතු වුවද, විගණිත 2021 ජනවාරි 21 දින දක්වා කර්මාන්තයේ වැඩ ආරම්භ කර හෝ නොතිබුණි. | අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුතා පැවති බැවින් මෙතෙක් කර්මාන්තය ඉටු නොකිරීම නිසා 2022 ඔක්තෝබර් 15 දිනට පෙර කර්මාන්තය නිම කර අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කරන බව 2022 අගෝස්තු 10 දින දැනුම් දී ඇත. | නොපමාව කර්මාන්තය ඉටු කරවා ගත යුතුය. |
| (ආ) | 2015 මැයි 11 දින රු 83,373,432.ක වියදමින් සභාව නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර2016 දෙසැම්බර් 31 දින වනවිට ඒ සඳහා රු.21,559,211 ක් ගෙවා තිබුණි . එහෙත් පරිපාලන සහ තාක්ෂණික ගැටළු හේතුවෙන් එහි වැඩ ,වසර 05කට අධික කාලයක සිට නතර කර දමා තිබුණි. | කොන්ත්‍රාත් සමිතියට මිලියන 27ක් පමණ ගෙවීමට ඇති බවත්, එම මුදල ගෙවීම සඳහා සහ කර්මාන්තය ඉදිරියට කරගෙන යාම සඳහා කොන්ත්‍රාත් සමාගම, උපදේශක ආයතනය, පළාත් පාලන කොමසාරිස්, ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ සමඟ සාකච්ඡාවක් 2022 අගෝස්තු 19 දින සිදු කර ඉදිරි කටයුතු කරන බව දන්වා ඇත. | නොපමාව කර්මාන්තයේ වැඩ යලි ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කර ඉදිකර තිබුණු කර්මාන්ත 03 ක් සඳහා රු.2,856,631 ක් ගෙවා තිබුණු අතර එම කර්මාන්තවල වැඩ විෂයයන් 08 ක් සඳහා රු.1,370,536 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අදාළ මුදල් අයකිරීමට කටයුතු කර විගණනයට වාර්තා කරන බව දන්වා ඇත. | වැඩිපුර ගෙවූ මුදල අයකිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ පළාත් පාලන ආයතනවල අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කර ඉදිකර තිබුණු කර්මාන්ත 02 ක් සඳහා රු.1,684,917 ක් ගෙවා තිබුණු අතර එම කර්මාන්තවල වැඩ විෂයයන් 06 ක් සඳහා රු.80,947 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල අඩුකර ගැනීමට කටයුතු කර විගණනයට වාර්තා කරන බව දන්වා ඇත. | වැඩිපුර ගෙවා තිබුණු මුදල් අයකරගත යුතුය. |